**ශීර්ෂය 207 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**
**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

--------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණ | නිර්දේශය |
|---|---|---|
| 1.6.1 (ආ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි දේපලෙහි අයිතිය පවරා ගැනීමට කටයුතු කරන ලෙස පසුගිය විගණන වාර්තා මඟින්ද පෙන්වා දී තිබුණද, එසේ පවරා ගැනීමකින් තොරව ඉඩම රු.මිලියන 911.5 ක් හා ගොඩනැගිලි රු.මිලියන 138 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි. | දේපළ වල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද 2021 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂ එකතුව රු.108,817,280 ක් වූ අතර, ණය පාලන ගිණුමේ ශේෂය රු.109,243,852 ක් විය. ඒ අනුව එම රු.426,572 ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම රු.426,572 ක වෙනස අනාවරණය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | කේවල ශේෂ ලේඛනය සහ ණය පාලන ගිණුම අතර පවතින මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1. බැරකම් හා බැදීම් වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට වැඩසටහන් 01 හි 1301 දරන වැය විෂයයට අදාළව ප්‍රතිපාදන ඉතිරිය රු.2,263,948 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව මුළු බැරකම රු.8,029,634 ක් වීම නිසා එම වැය විෂයය සඳහා ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා රු.5,765,686 ක බැරකම් වලට එළඹී තිබුණි. | අදාළ නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට එළඹීමට ක්‍රියා නොකළ යුතුව තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) 2021 දෙසැම්බර් 31 දින වන විට අධිකරණයේ නඩු 67 ක් විභාග කරමින් පැවති අතර, එම නඩු අතරින් බණ්ඩාරවෙල සහ මාතර දිසා අධිකරණයේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ සේවකයින්ට විරුද්ධව නඩු 02 ක් පවරා තිබුණි. එසේ රාජ්‍ය නිලධාරීන් වගඋත්තරකරුවන් කරමින් පවරන ලද එම නඩු දෙක මත පැවති අසම්භාව්‍ය බැරකම් එකතුව රු.141,500,000 ක් විය. | නිරීක්ෂණය සඳහා පිළිතුරු ලබාදී නැත. | මෙම අධිකරණ වල විභාග වන නඩු වලදී දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය සොයා බලා මැනවින් ඉටු කළ යුතු අතර, දෙපාර්තමේන්තුවට එරෙහිව පනවා ඇති නඩු පිළිබඳවත්, ඒ සඳහා වන බැරකම් පිළිබඳවත් වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබුණි. |

## 2.2. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 සිට 2022 කාලපරිච්ඡේදය තුළ ඇමරිකානු අරමුදල් දායකත්වය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 323.8 ක් වූ රජගලතැන්න පුරාවිද්‍යා සංරක්ෂණ ව්‍යාපෘතියට සමාලෝචිත වර්ෂයට සංශෝධිත ඇස්තමේන්තු අනුව ශුද්ධ ප්‍රතිපාදනය රු.31,069,722 ක් වූ නමුත්, 2021 වර්ෂයේදී ව්‍යාපෘතියේ විවිධ කටයුතු අත්හිටුවීම හේතුවෙන් වර්ෂය තුළ කැණීම් වැඩබිම් 02 ක් සහ සංරක්ෂණ වැඩබිම් 05 ක කටයුතු අවසන් කර තිබුණි. ඒ අනුව සංශෝධිත ප්‍රතිපාදනයෙන් රු.17,903,317 ක මුදලක් වැයකර සියයට 58 ක මූල්‍ය ප්‍රගතියක් හා සියයට 77 ක භෞතික ප්‍රගතියක් ලබා කරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේදී නිම කළ යුතුව තිබුණද වර්තමානය වන විට ඇති වී තිබෙන මූල්‍ය හා විවිධ බාධාවන් නිසා එම කාර්යයන් එදිනට නිම කිරීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි. | අදාළ නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | 2022 වර්ෂය තුළ අවසන් කළ යුතුව පවතින මෙම රජගලතැන්න වැඩ බිම තුළ 2021 වර්ෂය තුළද සැලසුම් කළ පරිදි කාර්යය ඉටු කර නොතිබුණි. ඒ අනුව රට තුළ පවත්නා වාතාවරණය පිළිබඳවද අවධානය යොමු කර විදේශ මුදල් ලැබීම් ඵලදායී කාර්යයක යෙදවීමට හා කාර්යය නිම කිරීමට අවධානය යොමු කළ යුතුව තිබුණි. |

## 2.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 V වගන්තිය | - | විශ්‍රාමිකයින් නැවත සේවයේ යොදවනු ලබන කාලසීමාව තුළදී සුදුසු අනුප්‍රාප්තිකයෙකු හඳුනාගෙන පුරුදු පුහුණු කළ යුතු වුවත්, එසේ පුරුදු කිරීමකින් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් නැවත නැවතත් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. | මේ වන විට සිටින නිලධාරීන් මඟින් එම කටයුතු ඉටු කරවා ගැනීමට කටයුතු කරමි. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටස, 13.2 වගන්තිය | - | කෝට්ටේ පුරාවිද්‍යා කෞතුකාගාර පරිශ්‍රයේ මෝටර් රථ 02 ක්, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ මෝටර් රථ 02 ක්, යතුරු පැදි 06 ක් සහ ප්‍රාදේශීය කාර්යාලවල ලොරි රථ 02 ක් අපහරණය කිරීමට කටයුතු නොකර දිරාපත් වෙමින් ගාල් කර තිබුණි. | මෙම වාහන අපහරණය කිරීමට හා වෙන්දේසි කිරීමට කටයුතු කරමින් පවතී. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිය යාම, විශ්‍රාම යාම, වැඩතහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතුන් මත දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නොමැති සේවකයන්ගෙන් හා නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.4,413,293 ක් වූ ණය ශේෂ අතුරින් වර්ෂ 05 කට වැඩි ණය ශේෂවල එකතුව රු.1,392,955 ක් විය. එම හිඟ ණය ශේෂ 2021 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව පාලන අංශය මඟින් ලිඛිත පිළිතුරු ලබාදී නැත. මේ වන තෙක් එම ණය ශේෂ අයකරගෙන නැත. | මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 2.5. තැන්පත් ශේෂයන්

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඡායාරූප වාර්තාකරණ අංශයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කර තිබූ එකතුව රු.2,415,342 ක මුදලක් අදාළ කාර්යයන් සඳහා භාවිතා නොකර 2021 දෙසැම්බර් 31 දිනටද පොදු තැන්පතු ගිණුම තුළ නිශ්කාර්යාව තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | මෙම පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇති මුදල් අදාළ කාර්යය සඳහා භාවිතා කර කාර්යය නිම කළ යුතුයි. |
| (ආ) මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව වසර 02 ඉක්ම වූ තැන්පතු කල් ඉකුත් වූ තැන්පතු ලෙස සලකා මුදල් රෙගුලාසි 571 අනුව ක්‍රියා කළ යුතු වුවත්, තැන්පතු ගිණුම් 02 කට අදාළව එකතුව රු.48,068,751 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර තැන්පතු ගිණුම තුළ රඳවා තබාගෙන තිබුණි. | අදාළ නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | මෙම තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 2.6. බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.947,555 ක් වූ දෙපාර්තමේන්තුව වෙත සෘජුව බැර වන ආදායම් හඳුනාගෙන නිරවුල් කිරීමකින් තොරව මාස 06 ඉක්ම වූ මෙම ලැබීම් සහ හඳුනා නොගත් ලැබීම් ලෙස සටහන් කර බැංකු සැසඳුම් සකස් කර තිබුණි. | අදාළ නිරීක්ෂණය නිවැරදිය. | බැංකු ජංගම ගිණුමට සෘජුව බැරවන ආදායම් හඳුනාගෙන නිරවුල් කර බැංකු සැසඳුම් සකස් කළ යුතු වේ. |
| (ආ) 2021 දෙසැම්බර් 31 දිනට තැන්පත් කළ නමුත් බැර නොවූ රිසිට් පත්‍ර 02 ක එකතු වටිනාකම රු.303,825 ක් විය. මාස 06 කට වැඩි කාලයක සිට උපලබ්ධි නොවූ මෙම වටිනාකම හඳුනාගෙන නිවැරදි කිරීමකින් තොරව 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් පිළියෙල කර තිබුණි. | අදාළ නිරීක්ෂණය නිවැරදිය. | තැන්පත් කළ නමුත් බැර නොවූ තැන්පතු හඳුනාගෙන නිවැරදි කර, බැංකු සැසඳුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්යය භාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කැළණි විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය කිරීම සඳහා රාජ්‍ය සංස්ථාවකින් පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.1,494,434 ක මුදලක් 2020 දෙසැම්බර් 11 දින රජයේ ආදායමට බැර කර තිබුණි. 2021 වර්ෂයේ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරියගේ මූලිකත්වයෙන් පැවති රැස්වීමකදී ලබාදුන් උපදෙස් අනුව එම මුදල් නැවත ලබාගෙන එම අරමුණු හා කාර්යයන් ඉටු | රැස්වීමේදී ලබාදුන් උපදෙස් මත ක්‍රියා කර ඇත. එම මුදල් පරිහරණය සඳහා සැලසුම් සකස් කර ඇත. | ලබාදුන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| කිරීමට උපදෙස් ලබාදී තිබුණද, එම උපදෙස් ප්‍රකාරව ක්‍රියා කර නොතිබුණි. | | |
| (ආ) කැළණි විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රසායන සංරක්ෂණ අංශය මගින් සිදු කර තිබුණි. විහාරස්ථානයේ පවතින සිතුවම් සහ මූර්ති වර්තමානය වන විට විශාල වශයෙන් පතුරු ගැලවී ගොස් සහ හායනයට ලක්වී විනාශ වීමට භාජනය වෙමින් පැවතුණි. මෙම සිතුවම් හා මූර්ති සංරක්ෂණ කටයුතු සඳහා සේවකයින් 04 දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබූ අතර, විවිධ හේතූන් මත ඔවුන් මන්දගාමීව එම කාර්යයන් ඉටු කිරීම නිසා සිතුවම් හා මූර්ති සංරක්ෂණය සිදුකරන වේගයට වඩා වැඩි වේගයකින් ඒවා විනාශයට භාජනය වෙමින් පැවතුණි. | හැකි උපරිම අයුරින් මෙම සංරක්ෂණ කටයුතු සඳහා කාර්යය මණ්ඩලය යොදවා ඇත. රක්ෂණ සංස්ථාව මගින් ලබාදුන් ප්‍රතිපාදන යළි ලබාදෙන්නේ නම් සංරක්ෂණය කඩිනමින් සිදු කළ හැකිය. | දෙපාර්තමේන්තුවේ අරමුණු අතර සංරක්ෂණය වැදගත් කාර්යයක් වේ. කැළණිය වැනි මහජන ගෞරවයට නිරන්තරව භාජනය වන ස්ථානයක් සංරක්ෂණය කර ආරක්ෂා කිරීමට ක්‍රියා කළ යුතුයි. |
| (ඇ) දෙපාර්තමේන්තුවේ පුරාවස්තු ආරක්ෂක ඒකකය ඉදිරිපත් කළ තොරතුරු අනුව 2021 වර්ෂය තුළ පුරාවස්තු පනත උල්ලංඝනය කිරීමේ අවස්ථා 232 කට අදාළව අධිකරණයේ නඩු පවරා තිබුණි. එම නඩු අතර පුරාවස්තු සොරකම් කිරීමේ අවස්ථා 03 ක්, පුරාවස්තු විනාශ කිරීම් සම්බන්ධ නඩු 14 ක්, අනවසර කැණීම් සම්බන්ද නඩු 199 ක්, අනවසර අත්පත් කරගැනීම් සම්බන්ධ නඩු 02 ක් සහ වෙනත් නඩු 14 ක් පවරා තිබුණි. වර්ෂය තුළදී නඩු 122 ක් අවසන් කර තිබූ අතර, එමගින් එකතුව රු.38,865,000 ක දඩ මුදල් අයකරගෙන තිබුණි. නමුත් 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළ පුරාවස්තු සොරකම් කිරීම් සහ විනාශ කිරීම් සිද්ධීන් පිළිවෙලින් 273, 121 සහ 383 ක් වාර්තා වී තිබූ අතර, ඒ අනුව මෙම සිද්ධීන් කාලීනව වර්ධනය වී තිබුණි. | අදාළ නිරීක්ෂණය නිවැරදිය. | පුරාවස්තු සොරකම් කිරීම්, හානි කිරීම් සහ විනාශ කිරීම් වැළැක්වීම සඳහා ගත යුතු සුදුසුම ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු අතර, ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) කැණීම් අංශය මගින් පුරාවිද්‍යා ස්ථාන කැණීම් සහ කැණීම් වාර්තා සැකසීම් සම්බන්ධ ව්‍යාපෘති 12 ක් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.5,191,499 ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබුණි. වර්ෂ අවසානය වන විට ව්‍යාපෘති 04 ක කාර්යයන් නිම කර තිබූ අතර, එහි සමස්ථ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 37 ක් සහ 75 ක් විය. ඒ අනුව ව්‍යාපෘති 06 ක කාර්යය නිම කිරීමට නොහැකි වී තිබූ අතර, වර්තමානයේ පවත්නා මූල්‍ය අර්බුදය නිසා කාල නිර්ණය කටයුතු සඳහා යොමු කළ යුතු ව්‍යාපෘති තාවකාලිකව නතර කිරීම මේ සඳහා හේතු වී තිබුණි. | වර්ෂය තුළ කැණීම් සහ කැණීම් වාර්තා සැකසීම් ව්‍යාපෘති 12 ක් රු.5,191,499 ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ අතර, වර්ෂය අවසානය වන විට ව්‍යාපෘති 06 ක කාර්යයන් නිම කර තිබුණි. | රටේ පවත්නා තත්ත්වය කාර්යසාධනය සඳහා බාධාවක් වුවත්, 2020 වසරට සාපේක්ෂව 2021 වසර තුළ රට විවෘතව තැබීම හා කාර්යයන් ඉටු කිරීමේ හැකියාව පැවතීම නිසා ප්‍රගතිය ඉහළ නංවා ගැනීමට අවධානය යොමු කළ යුතුව තිබුණි. |
| (ඉ) දෙපාර්තමේන්තුවේ බස්නාහිර ප්‍රාදේශීය කාර්යාලය මගින් බස්නාහිර පළාත තුළ ඇති ස්ථාන 65 ක් ගැසට් කිරීමට යෝජිතව තිබුණි. නමුත් ස්මාරක ගැසට් කිරීමේ ලේඛනය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ එම කාර්යයන් අවසන් කර නොතිබුණි. | මෙම ස්ථාන ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කර ඇත. ඒ අනුව අදාළ ලේඛන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | ස්මාරක ගැසට් කිරීමේ කාර්යය සඳහා අවධානය යොමු කළ යුතුය. |
| (ඊ) දෙපාර්තමේන්තුවේ බස්නාහිර පළාත් කාර්යාලය යටතේ ඇති පාහියංගල ගල්ලෙන ආශ්‍රිත සංරක්ෂණ සහ කැණීම් කටයුතු 2012 වර්ෂයෙන් පසුව වසර 09 ක පමණ කාලයක් නතර කර දමා තිබුණි. විගණනය විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව අක්කර 40 ක පමණ භූමි ප්‍රදේශයක් අයත් මෙම ගල්ලෙන අවට මැණීම් කටයුතු සිදු කර මායිම් කණු සිටුවා නොතිබූ අතර, මෙම ගල්ලෙන සම්බන්ධව ගවේෂණය කර ගවේෂණ වාර්තාවක්ද නිකුත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | මෙම ගල්ලෙන අවට මැනීම් කටයුතු අවසන් කර මායිම් කණු සිටුවීමටත්, අදාළ ගවේෂණ වාර්තා නිකුත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (උ) 1998 වර්ෂයේදී අත්තනගල්ල ඔයෙන් හමු වූ වසර 1270 ක් පමණ පැරණි අඩි 59 අඟල් 11 පමණ දිගින් යුතු ඉපැරණි පාරුවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් රැගෙනවිත්, කොළඹ ජාතික කෞතුකාගාර භූමියේ ජල ටැංකියක තැන්පත් කර තිබුණි. මෙම පාරුව සංරක්ෂණය කිරීමේ කාර්යය භාරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත | සංරක්ෂණ ක්‍රමවේදය අවසන් වූ පසු නිසි තත්ත්වය යටතේ ප්‍රදර්ශනයට පියවර නොගැනීම සහ ස්වභාවික හානි සිදුවීම නිසා 2019 වසර අවසාන වන විට පාරුවේ බොහෝ කොටස් දැඩි ලෙස දිරාපත් වී ඇත. | දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය භාරය පුරාවිද්‍යාත්මක ස්ථාන, පුරාවස්තු පිළිබඳ ගවේෂණය, කැණීම් කිරීම හා සංරක්ෂණය වේ. එම ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වන සංරක්ෂණ කාර්යය නිසි පරිදි ඉටු නොකිරීම නිසා මෙම පුරාවස්තු හානි වී විනාශ වී |

| | | | |
|---|---|---|---|
| | පැවරී තිබූ අතර, ඒ සඳහා අවශ්‍ය වන පොලිඑතිලීන් සහ ග්ලයිකෝල් නැමති රසායන ද්‍රව්‍යයද රුපියල් මිලියන 04 ක් පමණ වැය කර මිලදීගෙන තිබුණි. නමුත්, 2001 වර්ෂය දක්වාම එම රසායන ද්‍රව්‍ය භාවිතා කර එම පාරුව සංරක්ෂණය කිරීම සිදු කර නොතිබූ අතර, එම රසායන ද්‍රව්‍ය වෙනත් කාර්යයන් දෙකකට භාවිතා කර තිබුණි. ඒ අනුව පසුව වෙනත් ක්‍රමවේදයකට මෙම පාරුව සංරක්ෂණය කිරීමේ කාර්යය ඉටු කිරීමට රසායන සංරක්ෂණ අංශය පියවරගෙන තිබුණි. නමුත් සංරක්ෂණ ක්‍රමවේදය හා කාර්යය නියමිත කාල රාමුව තුළ යෝග්‍ය පරිදි සිදු නොකිරීම නිසා 2021 වර්ෂය අවසාන වන විට පාරුවේ දැව කොටස් දැඩි ලෙස දිරාපත් වී පාරුව සම්පූර්ණයෙන්ම විනාශයට භාජනය වී තිබුණි. | | තිබුණි. ඉදිරියේදී එවැනි තත්ත්වයන් ඇති නොවීමට ක්‍රියා කළ යුතුව පවතින අතර, සියළු පුරාවස්තු ආරක්ෂා කිරීමට හා සංරක්ෂණය සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුව තිබුණි. |
| (ඌ) | රසායනාගාරය තුළ පවතින රසායන ද්‍රව්‍ය ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා අවශ්‍ය රාක්ක නොමැති වීමත්, අපහරණය කළ යුතු රසායන ද්‍රව්‍ය විවිධ හේතු මත අපහරණය කර නොතිබීමත් නිසා එම රසායන ද්‍රව්‍ය අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. තවද, එම රසායනාගාරය තුළම 1950 වර්ෂයේ පමණ සිට කැණීම් සහ සංරක්ෂණ අංශ මගින් සොයාගත් පුරාවස්තු විශාල ප්‍රමාණයක් පැවති අතර, ඇතැම් පුරාවස්තු සංරක්ෂණය කිරීමටද කටයුතු කර නොතිබුණි. අතීතයේ සිට විධිමත්ව සකස් කළ පුරාවස්තු පිළිබඳ ලේඛනයක් නොතිබූ අතර, 2020, 2021 වර්ෂවල පුරාවස්තු ලේඛනගත කිරීම් ආරම්භ කළද, වර්තමානය වන විට පුරාවස්තු විශාල ප්‍රමාණයක් ලේඛනගත කිරීමකින් තොරව අනාරක්ෂිතව පැවතුණි. | 2022 දී ලැයිස්තුගත කිරීම් හා ලේඛනගත කිරීම් ආරම්භ කරන ලදී. ලේඛනගත කිරීම් අවසන් කළ පුරාවස්තු අදාළ සුදුසු ස්ථාන වෙත භාරදීමට සැලසුම් කර ඇත. | අපහරණය කළ යුතු රසායන ද්‍රව්‍ය අපහරණය කිරීමට ක්‍රියා කළ යුතු අතර, ප්‍රයෝජනයට ගත හැකි රසායන ද්‍රව්‍ය ආරක්ෂිතව ගබඩා කර තැබීමටත් ක්‍රියා කළ යුතු වේ. අංශය භාරයේ ඇති පුරාවස්තු සංරක්ෂණය කර ආරක්ෂා කිරීමටත්, එම පුරාවස්තු සියල්ල විධිමත්ව ලේඛනගත කිරීමටත් පියවර ගත යුතුය. |

## 3.2. අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය මඟින් එකතුව රු.54,145,000 ක් වැය කර ව්‍යාපෘති 32 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.24,154,948 ක් වැය කර ව්‍යාපෘති 13 ක වැඩ අවසන් කර තිබුණි. ඒ අනුව විවිධ හේතු මත නිම කළ නොහැකි වූ ව්‍යාපෘති ගණන 19 ක් විය. | ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අවසන් කාර්තුවට යෝජිත ව්‍යාපෘති 18 ක කටයුතු ඉටු කිරීමට නොහැකි විය. | ව්‍යාපෘති 32 කින් 13 ක පමණක් කටයුතු ඉටු කිරීම නිසා සියයට 50 කවත් ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි. සැලසුම් කළ පරිදි කාර්යය භාරය ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) ගවේෂණ සහ ලේඛනගත කිරීම් අංශය යටතේ පුරාවිද්‍යා ස්ථාන 13 ක් පුරාවිද්‍යා රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කිරීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය සඳහා යවා තිබුණි. නමුත් ඒ අතරින් මාමඩුව මුල ඓතිහාසික සුසාන භූමිය සඳහා පමණක් අනුමැතිය ලැබී තිබුණි. තවද, ප්‍රකාශයට පත් කර ඇති රක්ෂිතයන් 176 ක මිනින්දෝරු සැලසුම් ලබා ගැනීම සඳහා සර්වේ ජනරාල් වෙතින් ඉල්ලීම් කර තිබුණද ස්ථාන 56 ක් සඳහා පමණක් මිනින්දෝරු සැලසුම් ලැබී තිබුණි. | අදාළ නිරීක්ෂණය නිවැරදිය. | වර්ෂය තුළ ඉටු කිරීමට සැලසුම් කළ කාර්යය භාරය ඉහළ කාර්යසාධන මට්ටමකින් ඉටුකර ගැනීමට අවධානය යොමු කළ යුතුය. |

## 3.3. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ රසායනාගාරයට සපයා ඇති විදුලි සැපයුම් දෝෂ සහ අධි පීඩන ජල සැපයුමක් ලබා නොදීම හේතුවෙන් එම අංශය භාරයේ පවතින රික්තක උඳුන, ආර්ද්‍රතා කුටිය, ජල පිරිපහදු පද්ධතිය සහ අක්ෂි සේදීමේ පද්ධතිය අදාළ සංරක්ෂණ කාර්යයන් සඳහා භාවිතා කිරීමට නොහැකිව නිශ්කාර්යය වත්කම් ලෙස රසායනාගාරය තුළ පැවතුණි. | රසායනාගාරයේ කටයුතු නව ඉදිකිරීමක් ලෙස කළ යුතු වුවද, නව ඉදිකිරීම් නවතා ඇති බැවින් ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම් කර ඇත. | විදුලි සැපයුම් දෝෂ සහ ජල සැපයුම් දෝෂ නඩත්තු අංශය මඟින් විසඳා දීමට කටයුතු කළ යුතු අතර, එමඟින් නිශ්කාර්යය වත්කම් ඵලදායී කාර්යයක යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) පුරාවිද්‍යාත්මක විවිධ කැණීම් වලදී හමු වූ චංචල පුරාවස්තු වන පෞරාණික කාසි විශාල ප්‍රමාණයක් දීර්ඝ කාලයක සිට අභිලේඛන හා නාණක විද්‍යා අංශය, රසායනාගාර අංශය සහ කලාප කාර්යාල වල විධිමත්ව ලේඛනගත කිරීමකින් තොරව පැවතුණි. 2020 විගණකාධිපති වාර්තාව ප්‍රකාරව මෙම කාසි ලේඛනගත කිරීම් ආරම්භ කර තිබුණද, 2022 අප්‍රේල් මස වන විටත් එම කාර්යයන් නිම කර නොතිබුණි. | අදාළ නිරීක්ෂණය නිවැරදිය. | චංචල පුරාවස්තු කඩිනමින් ලේඛනගත කිරීමටත්, ඒවා ආරක්ෂා කිරීමටත් ක්‍රියා කළ යුතුය. |

## 3.4. පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්තනගල්ල ඔයෙන් හමුවී කොළඹ ජාතික කෞතුකාගාර භූමියේ තැන්පත් කර තිබූ අත්තනගල්ල පාරුවේ හිමිකාරීත්වය සහ සංරක්ෂණමය කාර්යය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබුණි. නියමිත කාලවකවානුව තුළ යෝග්‍යතාව | උක්ත පාරුවේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම මත එය සංරක්ෂණ සීමා ඉක්මවා ගියද අපහරණය කළ නොහැක. එය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව නැවත ප්‍රදර්ශනය කිරීමට නියමිතය. | රට තුළ පවතින මූල්‍ය අර්බුධය වැනි වාතාවරණය පිළිබඳවද අවධානය යොමු කර ඵලදායී නොවන වියදම් අවම කිරීමටත් හානි හා පාඩු අවම වන ලෙස ක්‍රියා කිරීමටත් කළමනාකරණය කටයුතු කළ යුතුව තිබුණි. |

සංරක්ෂණ ක්‍රමවේදයන්ට අනුව මෙම පාරුව සංරක්ෂණය නොකිරීම නිසා එය ඉතා කුඩා දැව කොටස් දක්වා විනාශ වී තිබුණි. විනාශයට භාජනය වූ එහි දැවමය කොටස් තැබීමට ආධාරකයක් සකස් කිරීම සඳහා 2021 වර්ෂය තුළ එකතුව රු.1,770,876 ක් වැය කර තිබූ අතර, වර්තමානය වන විට එම දිරාපත් වූ දැව කොටස් සංරක්ෂණ සීමා ඉක්මවා තිබීම නිසා එහි සත්‍ය ප්‍රමාණයේ අනුරුවක් සකස් කිරීම සඳහා යළි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත ගෙනවිත් තිබුණි. ඒ අනුව හඳුනාගත නොහැකි තත්ත්වයෙන් දැඩි ලෙස විනාශ වූ මෙම පාරුවෙහි දැවමය කොටස් තැබීමට සකස් කළ මෙම යකඩ ආධාරකය නිශ්කාර්ය්‍ය වියදමක් බව නිරීක්ෂණය විය.

## 3.5 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය මඟින් එම ජලාශයට යටවන භූමිය තුළ තිබූ පුරාවස්තු, කැණීම් කර ඉවත් කර තිබූ අතර, අදාල කැණීම් කාර්යයන් ඉටු කිරීමට රු.10,000,000 ක මුදලක් 2019 ජනවාරි 19 දින වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි.ඒ පිළිබඳව සකස් කළ හානි ඇගයුම් වාර්තාවට අනුව එම පුරාවස්තු ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා කෞතුකාගාරයක් ඉදිකිරීමට යෝජනා කර ඒ සඳහා වන මූලික සැලසුම් හා ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත සිදු කළ දැන්වීමට අනුව කෞතුකාගාර ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සැලසුම් සකස් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. නමුත් 2022 වර්ෂය වන | යාන් ඔය කෞතුකාගාරයේ වාස්තු විද්‍යා සැලසුම් සංශෝධනය කර වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත යොමු කර ඇත. මෙම කෞතුකාගාරය ඉදිකිරීමෙන් අනතුරුව පුරාවස්තු ප්‍රදර්ශනය කිරීමට නියමිතය. | මෙම පුරාවස්තු ආරක්ෂා කිරීමට පියවර ගත යුතු අතර, ඒ සඳහා අවශ්‍ය කෞතුකාගාරය ඉදිකිරීමට අදාළ ව්‍යාපෘතියේ සහය ලබාගත යුතුය. |

| | | |
|---|---|---|
| විටත් එම කෞතුකාගාරය සඳහා ගොඩනැගිලි ඉදිකර නොතිබූ අතර, මෙම කෞතුකාගාරය ඉදිකිරීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමු නොකිරීම හේතුවෙන් එම පුරාවස්තු ආනාරක්ෂිතව තවදුරටත් අනුරාධපුර විශ්ලේෂණ ශාඛාවේ සහ පදවිය පුරාවිද්‍යා කලාප කාර්යාලය තුළ ගබඩා කර තිබුණි. | | |
| (ආ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා නීති අංශයක් ස්ථාපිත කර තිබුණි. එහි සේවය කරන සහකාර නීති නිලධාරීන් 2021 වර්ෂය තුළ දිවයින පුරා ඇති විවිධ අධිකරණවල විභාග කරන නඩු සඳහා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටීමට සහභාගී වී තිබුණි. නමුත්, අධිකරණවල විභාග වන විවිධ නඩු සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කිරීමට මෙම නීති නිලධාරීන් සහභාගී වී තිබුණද, 2021 වර්ෂයේ ජූනි, ජූලි සහ අගෝස්තු මාස වලදී එසේ අධිකරණ නඩු සඳහා සහභාගී වීමට පෙර පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | නීති අංශයේ මාසික ඉදිරි වැඩසටහන් ජූනි, ජූලි, අගෝස්තු මාස වලදී අනුමත කර ගැනීමට නොහැකි විය. | නීති අංශයේ කටයුතු විධිමත් කළ යුතුව පවතින බව නිරීක්ෂණය වූ අතර, දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අධිකරණ වලට යාම වඩාත් විධිමත්ව හා පූර්ව ලිඛිත අවසර මත පමණක් සිදු කළ යුතුව තිබුණි. |
| (ඇ) දෙපාර්තමේන්තුවේ රසායනාගාර ගොඩනැගිල්ලේ වහලය, බිත්ති, සිවිලිම සහ කපරාරුවත්, විදුලි සැපයුම් පද්ධතියත් කැඩී බිඳී ගොස් දැඩි ලෙස හානි සිදුවී තිබුණි. එහි අභ්‍යන්තරයේ පවතින උපකරණ හා දේපළ වලටද හානි සිදුවිය හැකි තත්ත්වයක ගොඩනැගිල්ල පැවතියද, එම ගොඩනැගිල්ල කාර්යාලයක් පවත්වාගත හැකි තත්ත්වයට අළුත්වැඩියා කිරීමට හෝ එම ස්ථානයෙන් කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. | ලබාදී ඇති පිළිතුර ප්‍රකාරව මෙම ගොඩනැගිල්ල සඳහා සුදුසු ක්‍රියමාර්ගයක් ගත යුතුව ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත රාජ්‍ය සේවයේ යෙදීමට බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික නිලධාරීන් 09 දෙනෙකු එසේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්‍රාම යාමෙන් පසුව කොන්ත්‍රාත් පදනම මත නැවත බඳවාගෙන තිබූ අතර, එම නිලධාරීන් අතුරින්ද නිලධාරීන් 02 කු සඳහා පමණක් 2021 ඔක්තෝම්බර් 15 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සේවයේ යෙදවීමට අනුමැතිය ලබාදී තිබුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබෙන තෙක් අමාත්‍යාංශ ලේකම්තුමාගේ ආවරණ අනුමැතිය ලබාදුන් බැවින් සේවයේ යොදවා ගන්නා ලදී. | විශ්‍රාමික නිලධාරීන් සේවයේ යෙදවීමට ප්‍රථම රාජ්‍ය සේවා කොමිසමේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර, පවත්නා වලංගු නීති රීති හා චක්‍රලේඛ වලට අනුකූලව පමණක් ක්‍රියා කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 4373 ක්ද, තත්‍ය කාර්යය මණ්ඩලය 1858 ක්ද වීම නිසා පුරප්පාඩු සංඛ්‍යාව 2515 ක් විය. මෙම පුරප්පාඩු අතර, විධායක මට්ටමේ පුරප්පාඩු 39 ක් පැවති අතර, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 34 ක් පැවතුණි. මෙම පුරප්පාඩු සඳහා වැඩබලන සහ වැඩ ආවරණ වැනි පදනම් යටතේ සේවකයින් සේවයේ අනුයුක්ත කර තිබූ අතර, එම තනතුරු සඳහා ස්ථිරව බඳවා ගැනීමට විවිධ බාධාවන් ඇති වී තිබුණි. ඒ අනුව අනුමත මුළු කාර්යය මණ්ඩලයෙන් සියයට 58 ක පුරප්පාඩු පැවතීම නිසා අපේක්ෂිත කාර්යභාරය ඉටු කිරීමේදී විවිධ බාධාවන් ඇති වී තිබුණි. | විවිධ මට්ටම් වල පවතින මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පවතී. | බඳවා ගැනීම් පරිපාටිය සහ පවත්නා නීති රීති අනුව මෙම සේවක පුරප්පාඩු අවශ්‍යතාව මත පදනම්ව කඩිනමින් සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතුය. |